Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සතිපාසල

විෂයය :- සිංහල

සතිය -

ශ්‍රේණිය :- 11

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

**පාඩම : වස්සානය**

01 හැඳින්වීම කියවා පිළිතුරු සපයන්න.

I. කවි පෙළ උපුටාගත් කෘතිය :
II. එහි රචකයා :
III. ඔහුගේ භූමිකාවේ විශේෂතා 04ක් :
IV. ඔහුගේ උපන්දිනය සහ උපන් ගම :
V. මූලික අධ්‍යාපනය ලද පාසල :
VI. ඔහුගේ ප්‍රථම කාව්‍ය සංග්‍රහය :
VII. කවියා විසින් රචිත වෙනත් පද්‍ය සංග්‍රහ 05ක් :
VIII. කවියා රාජ්‍ය සම්මාන ලැබූ ගීත සංග්‍රහයක් :
IX. ඔහුගේ ළමා කාව්‍ය කෘති :
X. ඔහුගේ නිර්මාණ මෙහෙවර අගය කරන ග්‍රන්ථය :
XI. ඔහු ලියූ ජනප්‍රිය ගී 05ක මුල් පද පේළි :

02 මෙම පැදි පෙළේ අදහස ඔබේ වචනයෙන් ලියන්න.

03 පහත අදහස් ඉස්මතු කරන කාව්‍යෝක්ති උපුටා දක්වන්න.

I. ඔයෙහි වතුර ඉවුරු දෙකෙහි හැපෙමින් හඬ නගමින් ගලා බසී. -
II. කෙකටියා පඳුරෙහි සුදු පාට මල් පිපී තිබේ. -
III. ඔයට නැමුණු කුඹුක් අතුවල ගැවෙමින් වතුර ගලයි. -
IV. වැහි වළාකුළු සමූහය කඳු මුදුනෙහි නැවතී සිටී. -
V. අම්හිරි අභියෝගවලට මුහුණ දිය යුතුය. එයින් හෙට දවස යහපත් වනු ඇත. -

04 “මෙම පැදිපෙළට පාදක වී ඇත්තේ වස්සාන සමය ජීවී අජීවී පරිසර වස්තූන් කෙරෙහි බලපෑ ආකාරයයි.” මෙහි සඳහන් වන,

I. ජීවී පරිසර වස්තූන්
II. අජීවී පරිසර වස්තූන් ඉස්මතු වන උදාහරණ උපුටා දක්වන්න.

05 කවියා අජීවී වස්තූන් සජීවකරණයෙහිලා භාවිත කළ උපක්‍රම 03ක් උදාහරණ ඇසුරෙන් පැහැදිළි කරන්න.

06 මෙම කවිපෙළෙන් ඉස්මතුවන ජීවන දර්ශනය උදාහරණ දක්වමින් විස්තර කරන්න.